


විදුදය

භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**VIDUDAYA**

**Journal of Language, Literary, Cultural and Media Studies**

**Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura**

**2023, 02 (02): 26-36**

ISSN: 3051-5424

Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya


# පී. බී. අල්විස් පෙරේරාට විෂය වූ වැටුප් ශ්‍රමික කම්කරු ප්‍රජාව: ‘වේදනාව’ කාව්‍ය සංග්‍රහය ආශ්‍රයෙන් කරන ලද විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

## Wage-Labour Community through P. B. Alwis Perera’s Poetic Subjects; An Analytical Study based on “Wedanawa” (Pain) Poetry Collection.


ආචාර්ය හංසමාලා රිටිගහපොළ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
hansamala@sjp.ac.lk



## Abstract

P.B. Alwis Perera is identified as a poet belonging to the second generation of the Colombo era, who was influenced by the Socialist Movement which spread after the 1930s in Sri Lanka. Of all his poetry collections, ‘Wedanawa’ is the ultimatum that signals the impact mentioned above. The objective of this study is to analyze how the poet has depicted wage-labour community in this particular collection. The analysis also focuses on how Sri Lankan poetic movement evolved from being limited to aesthetic and religious themes during the Anurdhapura era to focus on social realities. The study emphasizes P.B Alwis’ unique contribution to the progress of the Sinhala poetic tradition as a Romantic poet. The analysis of the sample, which is the ‘Wedanawa’ poetry collection shows that the poems are composed to portray the ideologies associated with Classism of the poet. A qualitative analysis of the sample was carried out using Marxist and Socialist concepts on wage-labours and labour community. Hence this is an instance which breaches the idea that ‘Art for art’s sake’ and establishes the conceptual orientations of class-based social realities that the poet represents. Therefore, this poetry collection can definitely be identified as a one that changed the direction of Sinhala poetry to a novel avenue.



**Key words:** Labour class, P. B. Alwis Perera, Socialist Movement, Wage-labour.

## 1. හැඳින්වීම

යටත්විජිත පාලනය යටතේ එතෙක් මෙරට ක්‍රියාත්මකවූ වැඩවසම් ක්‍රමය අවසාන වීමෙන් අනතුරුව උද්ගත වූ නව අර්ථ ක්‍රමය හේතුවෙන් ශ්‍රමයට වැටුප් ලබන කම්කරු ප්‍රජාවක් බිහි විය. චාරිත්‍රානුකූල රාජකාරී ක්‍රමයකට කැපව සිටි මෙරට ශ්‍රම බලකාය, එතැන් සිට මුළුමනින්ම වෙනස් මුහුණුවරකින් අරුත් ගැන්විණ. දේශප්‍රේමය, ස්වභාව සෞන්දර්යය, ප්‍රේමය හා සමාජ සංශෝධනය ආදී මාතෘකා පමණක් පාදක කරගත් නූතන සිංහල කාව්‍ය නිර්මාණවලට, උක්ත කම්කරු ප්‍රජාව විෂය වන්නේ එක්දහස් නවසිය තිස් ගණන්වලින් පසුවය. ඒ, එවක ලංකාවේ පැතිරී ගිය සමාජවාදී ව්‍යාපාරයේ බලපෑම නිසාය. එහිලා ප්‍රමුඛත්වය ගත් කවීන් අතර ප්‍රමුඛව පෙනෙන කවියෙකු ලෙස පී. බී. අල්විස් පෙරේරා සඳහන් කළ හැකිය. ඔහුගේ 'වේදනාව' නම්වූ කාව්‍ය සංග්‍රහයම පෝෂණයවී ඇත්තේ සමාජවාදී අදහස්වලිනි. ඒ අනුව පී. බී. අල්විස් පෙරේරා 'වේදනාව' කාව්‍ය සංග්‍රහයෙන් වැටුප් ශ්‍රමික කම්කරු ප්‍රජාව නිරූපණය කර අර්ථ දක්වා ඇත්තේ කෙසේද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අභිමතාර්ථයයි. කොළඹ යුගයේ කවීන්ට සපුරා ආගන්තුක වූ මාතෘකාවක් ප්‍රස්තුත කරගනිමින් එකී සමාජ අද්දැකීම කෙරෙහි පාඨක අවධානය යොමු කරවීම උදෙසා ප්‍රෝත්සාහී වූ අල්විස් පෙරේරාගේ කාර්යභාරය අවධානයට ලක්කිරීමද මෙහිදී අපේක්ෂිතය. වැටුප් ශ්‍රමික කම්කරු ප්‍රජාව කෙරෙහි වූ අල්විස් පෙරේරාගේ දෘෂ්ටියත් වේදනාව කාව්‍ය සංග්‍රහයට පාදක වූ සමාජ, ආර්ථික, දේශපාලනික පසුබිමත් විශ්ලේෂණය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් සිදු කෙරෙන අතර කොළඹ යුගයේ කවියෙකු පිළිබඳව මෙබඳු ආස්ථානයක සිට විග්‍රහ කිරීම මෙහි සුවිශේෂත්වයයි.

මෙම අධ්‍යයනය මුද්‍රිත මූලාශ්‍රය පදනම් කරගනිමින් මාක්ස්වාදී න්‍යාය හා සමාජ විද්‍යාත්මක සංකල්ප පාදක කරගනිමින් අන්තර්ගත විශ්ලේෂණාත්මක ක්‍රමවේදය උපයෝගී කොටගෙන සිදු කෙරෙන ගුණාත්මක පර්යේෂණයකි. මෙහි ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් භාවිත කරන ලද්දේ වේදනාව කාව්‍ය සංග්‍රහයයි. ද්විතීයික මූලාශ්‍රය ලෙස යොදා ගත්තේ මාක්ස්වාදී න්‍යාය හා සමාජ විද්‍යාත්මක සංකල්ප අන්තර්ගත ශාස්ත්‍රීය ග්‍රන්ථ, පර්යේෂණ වාර්තායි.

## 2. සාකච්ඡාව

පී. බී. අල්විස් පෙරේරා කොළඹ යුගයේ දෙවැනි පරපුර නියෝජනය කළ කවියෙකි. කොළඹ තරුණ කවීන් ලෙස හැඳින්වූ කොළඹ යුගයේ දෙවැනි පරපුරේ කවීන් කෙරෙහි බහුල ලෙස බලපෑවේ බටහිර ආභාසයයි. එවක ප්‍රචලිතව පැවති රෝමාන්තිකවාදයේ හා සමාජවාදී ව්‍යාපාරයේ බලපෑමටත් කොළඹ යුගයේ දෙවැනි පරපුරේ කවිය නොමඳව ලක්විය. ''පොදු ජනයාගේ ජීවිත අත්දැකීම් කවිය සඳහා විෂය කරගැනීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අවධියක් ලෙසද කොළඹ යුගයේ තරුණ කවීන්ගේ සමය සැලකිල්ලට ලක්වී තිබේ. තමන් විඳින දුක් දොම්නස් කවියට නගන හෙයින් මේ කවීන් ජනකවි පරපුරට සමීප වූවන් සේද හඳුන්වාදී ඇත. කෙසේවුවද මේ තත්ත්වය කෙරෙහි වඩාත් හේතුවන්නට ඇත්තේ තත්කාලීනව මෙරට දේශපාලන ක්ෂේත්‍රයෙහි රැව් දුන් මතිමතාන්තර යැයි සිතිය හැකිය. මේ අවධිය වූකලි වාමාංශික දේශපාලන ව්‍යාපාරය මෙරට ආරම්භවූ වකවානුවයි. ඇතැම් විචාරකයකු කොළඹ කවිය මේ ව්‍යාපාරයෙහිම ප්‍රතිඵලයක් ලෙස හඳුන්වාදීමට උත්සුක වී ඇත්තේ එම කරුණු සැලකිල්ලට ගනිමින් යයි සිතිය හැකිය'' (ධම්මින්ද හිමි, 1991:13). මෙහි දක්වා ඇති පරිදි උක්ත කවීන්ට බලපෑ වාමාංශික දේශපාලන ව්‍යාපාරයත් බටහිර කාව්‍ය ක්ෂේත්‍රයෙහි ඇතිවූ පරිවර්තන තත්ත්වයත් පිළිබඳව කුලතිලක කුමාරසිංහ කරුණු කීපයක් දක්වා ඇත. ඒ මෙසේය.

- ගැමි පරිසරය හා කෘෂි අර්ථ ක්‍රමය යටපත් කරගෙන පිබිදුණු කාර්මික විප්ලවය
- ප්‍රංශ විප්ලවයෙන් පසු රූසෝ, වොල්ටෙයර් යන දාර්ශනිකයන්ගේ නව මතිමතාන්තර හේතුකොටගෙන, යුරෝපීය ජනතාව තුළ ඇතිවූ මානසික විපර්යාසය
- රුසියානු විප්ලවයෙන් පසු යටත්විජිතවාදය සම්බන්ධයෙන් ජනතා හදවත්හි ඇතිවූ ද්වේශය හා පන්ති පුරුෂාර්ථ පිළිබඳ කාල් මාක්ස්ගේ විග්‍රහය
- චාල්ස් ඩාවින්ගේ පරිණාමවාදය
- සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනෝ විග්‍රහය

යථෝක්ත සමාජමයවූත්, ආර්ථිකමයවූත්, බුද්ධිමයවූත් බලවේග එකල සාහිත්‍යකරුවන්ගේ මානසික තත්ත්වය පරිවර්තනයට ලක්කිරීමේලා තුඩුදුන්නේය. ඔවුන් විසින් නැතිවී යන ස්වභාවධර්මයත්, වෙනස්වන සමාජයත්, පැතිර යන බුද්ධි විෂයීය හා මනුෂ්‍යත්වය පිළිබඳ දයාබරිත අනුකම්පාව පිළිබඳ නව ආකල්පය අළලා රචනා කිරීමට පෙලඹුණු බැව් පෙනේ'' (කුමාරසිංහ,2001:67).

ඒ අනුව කොළඹ යුගයේ කවීන්ගේ කාව්‍ය අද්දැකීම් ඊට පෙර සිට කවීන්ට වඩා පැහැදිලිවම වෙනස් විය. ඒ බව ඔවුන්ගේ කාව්‍ය නිර්මාණවලට පාදක කරගත් වස්තුවිෂය විමර්ශනය කිරීමේදී හඳුනාගත හැකිවේ. ''කවීන්ගේ සිතුවිලි හිර කළ පාරම්පරික බැමි ක්‍රමයෙන් ලිහිල්ව යාමත්, පෞද්ගලික අනුභූති ප්‍රකාශනයට ඔවුන් නැඹුරුවීමත් පැහැදිලි ලෙසම දක්නට ලැබෙන්නේ මේ යුගයෙහිය. එබැවින් ඔවුන් ස්වකීය මුහුණුවර තම කවි මගින් යම් තරමකට ප්‍රකට කරන්නට සමත් වූ බව කිව හැකිය. ඒ සම්බන්ධව වඩාත් කැපී පෙනෙන්නේ කොළඹ යුගයේ මුල් පරපුරේ කවීන්ට වඩා දෙවැනි පරපුරට අයත් තරුණ කවීන් බව කිව යුතුය. එහෙත් ඔවුන්ගේ ප්‍රධාන දුර්වලතාව ලෙස පෙනී යන්නේ බොහෝවිට තම නිර්මාණවල කලාත්මක ලක්ෂණ ඉහළ මට්ටමින් රැක ගැනීමට අසමත්වීමයි. එම අඩුව නොපැවතිණි නම් ප්‍රේමය, ආදරය බඳු පෞද්ගලික සංවේදනා පමණක් නොව, සමකාලීන සමාජ ගැටලු පවා විෂය කොට ගනිමින් කවි ලිවීමට ඔවුන් විසින් දක්වන ලද උනන්දුව වඩාත් ඵලදායක වනු නිසැකය''(ධම්මින්ද හිමි, 1991:185). අල්විස් පෙරේරා ප්‍රමුඛ කොළඹ යුගයේ දෙවැනි පරපුරේ කවීන්ගේ කාව්‍යාන්තර්ගතයෙහි විශේෂත්වය කෙරෙහි විචාරක අවධානය යොමුවී ඇති බව එනයින් පැහැදිලි වේ. ''තත්කාලීන සමාජ තත්ත්වය පිළිබඳ විවරණයක යෙදීම කවියාගේ පරමාර්ථය'' බව පවසන ආරිය රාජකරුණා, අල්විස් පෙරේරාගේ ''වේදනාව'' කාව්‍ය සංග්‍රහය වාර්තා ස්වරූපය බොහෝ දුරට අනුගමනය කොට රචිත කාව්‍යයක් ලෙස දක්වා ඇත (රාජකරුණා,2004:22). වේදනාව කාව්‍ය සංග්‍රහයෙහි අන්තර්ගත 'කම්කරු පවුල' හා 'සාගින්නෙන් පෙළෙන ළමයා' කවි පන්ති ගැන රාජකරුණාගේ අදහස මෙබඳුය. ''කවියා ශෝකය, පිළිකුල වැනි හැඟීම් පාඨකයා තුළ ඇති කිරීමට සමත් වන නමුදු කරුණා, බීබත්ස වැනි රස නිපදවීමට අසමත් වෙයි''. මේ කම්කරු පවුල ගැන පැවසූ අදහසයි. ''සාගින්නෙන් පෙළෙන ළමයා නඟන අඳෝනාව අසා සිටින පාඨකයා තුළ අනුකම්පාවක් ඇති විය හැකි නමුදු කාව්‍ය රසයක් පහළ නොවේ''(රාජකරුණා,2004:23). මේ අදහස්වලින් පැහැදිලි වන්නේ තත්කාලීන කාව්‍ය නිර්මාණ අතර අල්විස් පෙරේරාගේ කාව්‍යාන්තර්ගතයෙහි වැදගත්කම කෙරෙහි මෙකී විචාරකයන් දක්වා ඇති අඩු සැලකිල්ලයි. ඒ අතර ඔහුගේ කවියෙන් ප්‍රකට කෙරුණු දෘෂ්ටිය අවධාරණයට ලක් කළ විචාරකයෝද වූහ. ''ධනේශ්වර විරෝධී වාමාංශික අදහස් පතළ වන කාලයක, අල්විස් පෙරේරාගේ චින්තනයද ඒ අදහස් උදහස් පිළිබිඹු කෙළේය. ඔහු, යටත් විජිතවාදය මෙන්ම ධනේශ්වර ක්‍රමයද පිළිකුල් කෙළේය. එහෙත්, ඓතිහාසික වසයෙන් මේවායෙහි උද්භවයද, වර්තමාන පැවැත්මද, විද්‍යානුකූලව නොහැදෑරීම නිසා ඇතිවූ කඩතොලුවලින් ඔහුගේ චින්තනය පිරී පවතී'' (විජේගුණසිංහ,2017:99). පී. බී. අල්විස් පෙරේරා පැදි එකතුව සංස්කරණය කරන අමර හේවාමද්දුම හා සරත් විජේසූරිය යන සංස්කාරකවරුන්ගේ අදහස මෙසේය. ''ප්‍රගතිශීලි සිංහල කවියෙහි පුරෝගාමී කවියා ලෙස අල්විස් පෙරේරා නම් කිරීම යුක්තියුක්ත බව අපි මෙහි මුලින්ම සඳහන් කළෙමු. කවියෙහි ගමන් මග වෙනස් කිරීමට උත්සුක වීමේදී ඔහු තමා ජීවත්වූ සමාජ වටපිටාව ප්‍රතිනිර්මාණය කිරීමට සමත්වීම එකරුණ තහවුරු කිරීමට මුල්වේ. ආර්ථික අසීරුතාවන් නිසා

ජීවිතය අතිශය දුක්බර ලෙස ගෙවන්නන්, විවිධ අන්දමේ සූරාකෑම්වලට ලක්වන ළමයින්, මිනිසුන් හා ගැහැනුන්, සමාජ දූෂණයට මුල්වන නිලධාරීන්-දේශපාලකයන් හා වරප්‍රසාදලත්තන් අල්විස් පෙරේරා සිය රචනා සඳහා මුල්කර ගත්තේය. ඒ රචනා විමසිල්ලට ලක් කරන විට ඔහු සමාජ අසාධාරණයට එරෙහිව නැගී සිටි කැරලිකාරයෙකු බව පෙනේ. එපමණක් නොව පුළුල් දේශපාලන දෘෂ්ටියක් ඔහු සතුවූ බවත් මානව භක්තිය නිතරම පෙරටු කරගෙන කටයුතු කළ බවත් පෙනේ'' (හේවාමද්දුම හා විජේසූරිය,1993:xxiv).

මේ සියලු මතවාද හා අදහස්වලින් පැහැදිලි වනුයේ අල්විස් පෙරේරාගේ නිර්මාණවලට සමාජවාදී ව්‍යාපාරයෙන් ලද බලපෑමයි. අල්විස් පෙරේරාගේ දේශපාලන දිවිය පිළිබඳ ධර්මප්‍රිය ජයකොඩි මෙබඳු අදහසක් පළකර ඇත. ''පී. බී. කවියකු පමණක් නොව, අරමුණක් ඇතිවැ ක්‍රියා කළ දේශපාලනඥයකු බවද අමතක නොවන සිද්ධියකි. ඔහු දේශපාලනයට ඇදී ආයේ, අධිරාජ්‍ය විරෝධි ජාතික ව්‍යාපාරයවූ සූරිය මල් ව්‍යාපාරයත් සමඟය. අධිරාජ්‍යවාදී සූරා කන්නන්ගෙන් රට නිදහස් කරගැනීම සඳහා, ඔහු කවි ලීවේය. ලංකාවේ අධිරාජ්‍ය විරෝධි ප්‍රථම පුවත්පත වූ සමසමාජ පත්‍රයට ඔහු කවි ලීවේය. ඒ ලීවේ වනමල් ගැනවත්, දියඇලි ගැනවත්, සමනලයන් ගැනවත්, වලාකුළු හෝ වනරොද, දෙවටොර, දඟයුග, නැහැය, දෙනුවන ගැනවත් නොවේ. දේශපාලනය ගැනය. ඔහු අධිරාජ්‍ය විරෝධියෙක් වූවා මිස එකම දේශපාලන පක්ෂයකවත් සාමාජිකයෙක් නොවූයේය. එහෙත් ඔහු වරක් පිලිප් ගුණවර්ධන මහතාගේ දේශපාලන පක්ෂයෙන් (ඇම්.ඊ.පී.) දඹදෙණිය පාර්ලිමේන්තු ආසනය තරග කළේය. අවසානයේ ඔහු සියලුම දේශපාලන පක්ෂවලට විරුද්ධ වූ අතර වාමාංශික පක්ෂවල සමගිය අවංකවය අපේක්ෂා කෙළේය'' (ජයකොඩි,1969:83).

මෙසේ වස්තු විෂයයෙන් හා කාව්‍ය දෘෂ්ටියෙන් වෙනස් මගක් අනුදත් පී. බී. අල්විස් පෙරේරා වැටුප් ශ්‍රමික කම්කරු ප්‍රජාව මතු නොව සමස්ත පීඩිත පන්තිය වෙනුවෙන්ම කවි රචනා කළේය. 'වේදනාව' එකී නිර්මාණ අන්තර්ගත කාව්‍ය සංග්‍රහයයි. ඒ කවි වාර්තා ස්වරූපයෙන් යුතුවී යැයි අදහස් පළවූ නමුදු එකී නිර්මාණවල අන්තර්ගතය විශ්ලේෂණය කිරීමේදී වාමාංශික දේශපාලන ව්‍යාපාරයේ බලපෑම මනාව හඳුනාගත හැකිය.

අල්විස් පෙරේරා සිය නිර්මාණවලින් සාකච්ඡා කරන වැටුප් ශ්‍රමික කම්කරු ප්‍රජාව වූකලි නිෂ්පාදන කාර්යයට එක්වී ප්‍රාග්ධන හිමියාගෙන් වැටුප් ලබන කායික ශ්‍රමිකයන්ය. ''ධනපති ක්‍රමය තුළ ද්‍රව්‍යමය නිෂ්පාදනය මෙන්ම බුද්ධිමය නිෂ්පාදනයද හසුරුවනු ලබන්නේ ප්‍රාග්ධන හිමිකරුවා විසිනි. ප්‍රාග්ධනය යනු රාශිභූත වූ අතීත ශ්‍රමයයි. එහි අයිතිය පාලක පන්තිය සතුවන අතර සමාජයේ වසන අනෙක් සියලු වෘත්තිකයන් ප්‍රාග්ධන හිමිකාරත්වයේ නියමයට අනුව නිෂ්පාදන කාර්යයට එක්වනුයේ වැටුප් ශ්‍රමිකයන් වසයෙනි. පැරණි සමාජවල නිෂ්පාදන මාර්ග හා බැඳුණු යම් අයිතියක් ශ්‍රමිකයාට තිබුණිද නව ක්‍රමය යටතේ ශ්‍රමිකයා සම්පූර්ණයෙන්ම නිෂ්පාදන මාර්ගවලින් වියෝ කෙරෙයි. ශ්‍රමිකයාට ඇති එකම අයිතිය ප්‍රාග්ධන හිමියා නියම කරන වැටුප පමණි. නිෂ්පාදන මාර්ගවල හා ඒවා මෙහෙයවීමේ සම්පූර්ණ අයිතිය ප්‍රාග්ධන හිමියා සතුය. මෙලෙස සියලු මූලික නිෂ්පාදකයන් ඔවුන්ගේ වෘත්තිය කුමක් වූවත් තවදුරටත් නිදහස් නිෂ්පාදකයන් නොව වැටුප් ශ්‍රමිකයන්ය'' (බණ්ඩාර,2020 අගෝස්තු-දෙසැම්බර්:133-134). අල්විස් පෙරේරා සිය කාව්‍ය නිර්මාණවලින් විශද කරනුයේ උක්ත වැටුප් ශ්‍රමික කම්කරු ප්‍රජාවගේ ශ්‍රම සූරාකෑම පිළිබඳවය. ඔවුන්ට සිදුවී ඇති අසාධාරණය පිළිබඳවය. එය එතෙක් කිසිදු නිර්මාණකරුවෙකුගේ අවධානයට පාත්‍ර නොවූවකි. 'වේදනාව' කාව්‍ය සංග්‍රහය සම්පූර්ණයෙන්ම පාහේ වෙන්වී ඇත්තේ සමාජ විෂමතා කරණ කොට ගෙන සිදු වූ, ඇති - නැති පරතරය පිළිබඳ විශ්ලේෂණයක් කිරීමටය. සමස්ත සමාජය පුරාම සිදු වී ඇති විවිධ වෙනස්කම් පිළිබඳව සමාජ සංශෝධනාත්මක විග්‍රහයක් කරන කවියා විවිධාකාර වෘත්තීන්වල නියැළෙන වැටුප් ශ්‍රමිකයන් පිළිබඳවද එහිදී අවධානයට ලක් කර ඇත. මෙහිලා අවධානය යොමු කර ඇත්තේ එබඳු වෘත්තීන් අතුරින් කම්කරු ශ්‍රමය හා වැටුප් ශ්‍රමිකයන් පිළිබඳව සාකච්ඡා කෙරුණු කවි පන්තීන් කෙරෙහි පමණකි.

''සියලු ධනයේ මූලාශ්‍රය ශ්‍රමය බව දේශපාලන ආර්ථිකවේදියෝ පවසත්. ශ්‍රමය විසින් ධනය බවට පරිවර්තනය කෙරෙන ද්‍රව්‍ය සපයන ස්වභාව ධර්මය හැරුණු කොට ශ්‍රමයද සැබැවින්ම එවැනි මූලාශ්‍රයකි. එහෙත් ශ්‍රමය ඊටත් වඩා අපරිමිතය. සකලවිධ මානව පැවැත්මේ පදනම ශ්‍රමයයි'' (බණ්ඩාර,2020 අගෝස්තු-දෙසැම්බර්:112). ධනවාදී

අර්ථ ක්‍රමයේදී ශ්‍රමය පදනම් කරගනිමින් බිහි වූ නව ප්‍රජාව හඳුන්වනු ලැබූවේ කම්කරුවන් ලෙසයි. කාල් මාක්ස්ට අනුව බටහිර සමාජ ක්‍රමය ප්‍රධානතම යුග හතරක් ඔස්සේ සංවර්ධනය වී ඇත. ඒවා නම් ප්‍රාථමික කොමියුනිස්ට් සමාජය, ඓතිහාසික සමාජය, වැඩවසම් සමාජය හා ධනේශ්වර සමාජයයි. ප්‍රාථමික කොමියුනිස්ට්වාදී සමාජය පන්ති රහිත සමාජයකි. එතැන් සිට හමුවන සෑම අවදියකදීම සමාජ ක්‍රමය ප්‍රධාන පන්ති දෙකකට බෙදෙයි. ඓතිහාසික සමාජ අවදියේදී වහල් හිමියා සහ වහලා ලෙසද, වැඩවසම්වාදී සමාජ වකවානුවේදී රදල පන්තිය හා ප්‍රවේණිදාසයන් ලෙසද, ධනේශ්වර යුගයේදී ධනපති පන්තිය හා කම්කරු පන්තිය ලෙසය (ජයසිංහ,2004:46). එනම්, පුරාණ ග්‍රීසියේදී නිදහස් පුරවැසියා හා වහලා ලෙසද, පැරණි රෝමයේදී ප්‍රභුවරයා හා සාමාන්‍ය පුරවැසියා ලෙසද, වැඩවසම් යුගයේදී රදල ස්වාමියා හා ප්‍රවේණිදාසයා ලෙසද ශ්‍රේණිපතියා හා කුලියට වැඩ කරන්නා ලෙසද, සරලව කිවහොත් පීඩකයා හා පීඩිතයා (බණ්ඩාර,2020 අගෝස්තු-දෙසැම්බර්:121) ලෙස විවිධ නාමගැන්වීම්වලින් හැඳින්වෙමින් වරප්‍රසාද හිමි පන්තිය සහ වරප්‍රසාද අහිමි ශ්‍රමික පන්තිය පැවතුණි. කම්කරු පන්තිය, ඉතිහාසය පුරා එසේ පැමිණි ගමනේදී වර්තමාන සමාජ ක්‍රමයට අනුගතව බිහිවූ ශ්‍රමිකයෝ වෙත්. මේ ධනේශ්වර ක්‍රමය පිළිබඳව ප්‍රධාන ලක්ෂණ තුනක් ලංකා සමසමාජ පක්ෂය විසින් ප්‍රකාශිත 'මාක්ස්වාදයේ හෝඩිය' නම් වූ කෘතියේ දක්වා ඇත්තේ මෙසේය.

- ''හැමටම පළමු, නිෂ්පාදන මාර්ග (වතු, කර්මාන්තශාලා, පතල් යනාදිය) ධනේශ්වරයන් අතළොස්සක් පමණ වෙන වෙන තැනැත්තන් සතුව ඔවුන් විසින් බුක්ති විඳින බව පෙනේ. යන්ත්‍රයක් ක්‍රියාවේ යොදවන කම්කරුවාට එය අයිති නැත. නිෂ්පාදනයට වුවමනා උපකරණයන්ගෙන් කම්කරුවා වෙන් කරනු ලැබේ.
- දෙවැන්න නම්, වැටුප් ශ්‍රමය පැවැත්මයි. කම්කරුවා යමෙකුට පෞද්ගලික වශයෙන් අයිති දාසයෙක් නොවේ. හෙතෙමේ නීත්‍යානුකූලව නිදහස්ය. කම්කරුවෝ අන්‍යයන්ගේ (ධනපතියන්ගේ) යන්ත්‍රවල මෙහෙකිරීමට බඩගින්න විසින් පොලඹවන ලද්දාහුය. ජීවත්වීම සඳහා ඔවුන් තම ශ්‍රම ශක්තිය ධනපතියන්ට විකිණිය යුතුය. ධනපතියා කම්කරුවාගේ ශ්‍රම ශක්තියෙන් නිපදවනු ලබන භාණ්ඩ කොල්ල කා ගනියි.
- තුන්වැන්න, සියලුම භාණ්ඩ නිපදවන්නේද උපයන්නේද ගෙදරම ප්‍රයෝජනය පිණිස නොව පොළේ වෙළෙඳාම උදෙසා බවයි. භාණ්ඩ නිෂ්පාදනය යනු මෙය පසුව විස්තර කරනු ලැබේ.

ඉහත සඳහන් ලක්ෂණ තුන ධනපති ක්‍රමය යටතේ ඇති නිෂ්පාදන සම්බන්ධතා දක්වයි...නිෂ්පාදන මාර්ග අයිති කොටගෙන එයින් ලැබෙන ධනය පෞද්ගලිකව භුක්ති විඳින අයත් නිෂ්පාදන මාර්ගයන්හි වැඩෙහි යෙදෙන අයත්- එනම්, ධනපතියන්ද කම්කරුවන්ද පන්ති දෙකකට බෙදී සිටිති. සමාජය මුළුමනින්ම පන්ති දෙකකට බෙදෙන්නාවූ මේ පන්ති භේදය නම් ධනේශ්වර ත්‍රමයේ ලක්ෂණයව පවතින නිෂ්පාදනය පිළිබඳ මූලික සම්බන්ධතාවන්ගේ ප්‍රතිඵලයයි (කර්තෘ නැත,1948:4-5).

යටත් විජිත පාලනයට නතුව පැවති කාලයේදී ව්‍යාප්තවූ ආර්ථික බෝග සමඟ මෙරටටද නව කම්කරු පිරිසකගේ සම්ප්‍රාප්තිය සිදුවිය. එය 'නව කම්කරු පිරිස' ලෙස හැඳින්විය හැකි වන්නේ එතෙක් පැවති රාජාණ්ඩු ක්‍රමය යටතේ ව්‍යාප්තව තිබුණේ රාජකාරි ක්‍රමය බැවිනි. චාරිත්‍රානුකූලව කරනු ලැබූ එකී රාජකාරී ක්‍රමය හෙවත් වැඩවසම් ක්‍රමය 1832දී අවසන් විය. නව අර්ථ ක්‍රමය යටතේ ආරම්භක වගාව වූයේ 'කෝපි'ය. එහෙත් ශ්‍රී ලාංකේය ජීවන රටාවේ පදනම වූ රාජකාරී ක්‍රමය බිඳ වැටීම හේතු කොටගෙන ඉංග්‍රීසීන් විසින් අපේක්ෂා කරන ලද ශ්‍රම සැපයුම මෙරටින් ලැබුණේ නැත. මේ හේතුවෙන් මෙරටට සංක්‍රමණය වූ කම්කරුවන් පිරිස 'තේ'යුගය වන විට 100,000කට ආසන්න ප්‍රමාණයකි (ද සිල්වා,2005:48-55). එසේ පැමිණි කම්කරුවන් විඳි දුක් කම්කටොලුද අප්‍රමාණය. ඉංග්‍රීසි පාලකයෝ කිසිවිටෙකත් මෙම ජනතාවගේ දුක්ඛිත ජීවිතය දෙස අවධානය යොමු නොකළහ. ඒ ඔවුන් ප්‍රමුඛත්වය ලබාදුන්නේ සිය ආර්ථික තත්ත්වය නගා සිටුවාලීමේ අරමුණට පමණක් වන බැවිනි. එනිසාම වතු කම්කරුවන්ගේ සමාජය වහල් සමාජයක් බඳු විය. ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කිසිවෙක් හඬ

නොනැගුහ. හඬ නගන්නට කිසිවෙකු හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටියේද නැත. අල්විස් පෙරේරාගේ 'තේ දලු බිඳින තරුණිය' නම් කවි පන්තියට පාදක වන්නේ එකී වහල් සමාජය නියෝජනය කරන්නියකි.

කඳුකර ලැයිමකට විත් දුරු රටක සි　　ට
උසුලා සීත පිනි දී කුඩයට පි　　ට
හිමිදිරි පාන්දර නුඹ තේ නෙළන වි　　ට
ජීවන සටන් තතු සිහිපත් කෙරෙයි ම　　ට (අල්විස් පෙරේරා,1946:47)

වතු හිමියෝ මේ වැටුප් ශ්‍රමිකයන්ගේ ශ්‍රමයට සරිලන වැටුප් නො ගෙවත්. මෙකී අසාධාරණය දකින කවියා ශ්‍රමය සූරා කන වතු හිමියාට සිය අප්‍රසාදය පළ කර ඇත්තේ 'හොරා' යනුවෙන් ආමන්ත්‍රණය කරමිනි. මේ පන්තියෙහි ශ්‍රම සූරාකෑම කවියා දකින්නේ දෙහි ලෙල්ලකින් ඉස්ම මිරිකා ගන්නා අයුරිනි.

අළුයම පටන් සවසට හිරු බසින තු　　රා
මුළු දවසේම කළ සේවය වෙහෙස ද　　රා
සුළු වැටුපකින් ගෙන තේ වතු අයිති හො　　රා
බලු දානයක් දෙයි සවසට පවුල ක　　රා

දෙහි ලෙල්ලක් වගේ මිරිකාගෙන ඉ　　ස්ම
නො යැපෙන වැටුප් දී ලැබ සේවය උ　　ස්ම
උඹලා පෙළති ධනපතියෝ ලෙස වි　　ස්ම
කඳු උඩ හැදෙයි නීතියටත් පිට ගැ　　ස්ම (අල්විස් පෙරේරා,1946:47)

කම්කරු ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ යාමක් අධිරාජ්‍යවාදී පාලන සමයේ සිට කවියාගේ නිර්මාණයට පාදක වූ කාලය දක්වාම සිදු නොවූ බව මේ කවි පන්තියෙන් පැහැදිලිවේ. සෑම කල්හිම වරප්‍රසාද පන්තියේ සුඛ විහරණය සඳහා වැඩ කරන ජනතාවට ශ්‍රමය වැගිරීමට සිදුවන බව කවියා නිගමනයක් ලෙස දක්වා ඇත්තේ නීතිය පෙනී සිටින්නේද ඇතිහැකි අයගේ අවශ්‍යතා වෙනුවෙන් බව සඳහන් කරමිනි.

''ධනවාදී අර්ථ ක්‍රමය තුළ සෑම පුද්ගලයෙකුගේම එකම බලාපොරොත්තුව සහ උත්සාහය වනුයේ තමන්ගේ ආත්මාර්ථකාමී අවශ්‍යතා සපුරා ගැනීම සඳහා කෙනෙකු කෙරෙහි නීත්‍යනුකූල නොවූ බලයක් ලබාගැනීමට ක්‍රියා කිරීමයි. උපරිම ප්‍රමාණයෙන් නියම හැකියාවන් උද්දීපනය කර ගැනීමට අවකාශයක් නොසපයන, හුදු ශ්‍රමය මත පමණක් පදනම් වන පෞද්ගලික දේපළ ක්‍රමය යටතේ නිපදවෙන සෑම නව නිපදවීමක්ම පෙන්වනු ලබන්නේ විශාල වංචාවකට සහ කොල්ලකෑමට ඇති හැකියාවයි.... ධනවාදී අර්ථක්‍රමයේ අති විශාල නිෂ්පාදනයක් වන මුදල් පිළිබඳ අවශ්‍යතාව ජීවිතයේ එකම අවශ්‍යතාව හැටියටත් සිතා ඒ අනුව ක්‍රියා කිරීමට මිනිසා පෙලඹෙයි. මේ නිසා මුදල් කරා මානුෂික නොවන ආකාරයෙන් හඹා යාම ජීවිතයේ එකම නිෂ්ඨාව ලෙස මිනිසා සලකයි'' (මල්ලිකාරච්චි,2011:119). මේ අයුරින් බිහි වූ 'මුදල' කේන්ද්‍ර කරගත් සමාජ ක්‍රමයෙහි සුලබව දැකිය හැකි ව්‍යාපාර අතර සුළු ව්‍යාපාරයක් වූ සිල්ලර කඩද වේ. මේවා මහ පරිමාණ ව්‍යාපාර බවට පත් වන්නේ ව්‍යාපාර ඥානයත් ව්‍යාපාරිකයාගේ හැකියාවත් මතය. එබඳු ස්ථාවරත්වයකට සිය ව්‍යාපාරය ගෙන යාම සඳහා උත්සුක වන ව්‍යාපාරිකයන් බොහෝ විට ගන්නා ක්‍රියා මාර්ග අතර අඩු වැටුප් පරිමාවක් යටතේ සිය සේවකයන්ගෙන් වැඩි ශ්‍රම දායකත්වයක් ලබා ගැනීමේ ක්‍රියාවලියද වේ. එසේම මෙවැනි ව්‍යාපාරවල සේවය සඳහා බොහෝ විට යොදා ගනු ලබන්නේ වයසින් අඩු දරුවන්ය. ඒ අත්උදව්කරුවන් ලෙසිනි. විශේෂයෙන් මෙබඳු වෘත්තීන්වලට දරුවන් යොමු වන්නේ දෙමාපියන් අහිමිවීම, භාරකරුවන් නොමැති වීම, උන්හිටි තැන් අහිමිවීම වැනි කරුණු හේතුකොට ගෙනයි. සිය ළමා කාලය අහිමි කර ගනිමින් ජීවත් වීම උදෙසා, අඩු වැටුපකට මෙබඳු වෘත්තීන්හි යෙදීමට ඔවුන්ට සිදුවේ. 'සිල්ලර කඩේ කොලුවා' යන හිසින් රචිත මේ කවි පන්තියෙන් විශද වනුයේ අඩු වයස් ශ්‍රමිකයන්ගේ ශ්‍රම සූරාකෑම පිළිබඳවය.

දුප්පත් නෑ ගෙයක දැඩි වුණු මෙම කො ල්ලා
කඩයේ අත් උදව්වට ගෙනැවිත් ඉ ල්ලා
දමමින් කුණු පිරුණු මුළුතැන් ගෙට අ ල්ලා
ඔහු අසරණ ළදරු ජීවිතයක් ගි ල්ලා

දැලි කුණු රෙදි කඩක් ඉණ පහළට හා ද
ඉසකෙස් වැඩී ගිය කැලයක් මෙන් යෝ ද
මොහු කඩ කුස්සියෙහි දහවල් සහ රෑ ද
මේ අම්මා කෙනෙකු වැදූ දරුවෙක් නේ ද (අල්විස් පෙරේරා,1946:30)

මෙහි මුදලාලි නියෝජනය කරනුයේ වරප්‍රසාද හිමි පන්තියයි. කොලුවා නියෝජනය කරනුයේ පීඩිත පන්තියයි. තවද මෙහි ශ්‍රම සූරා කෑමට අමතරව පීඩනයට ලක් කිරීමද සිදුවන බැව් ප්‍රකාශිතය. එමතු නොව මෙබඳු අසරණ සේවකයෙකුට හිංසනයට ලක් වෙමින් සේවා කිහිපයක් කිරීමටද සිදුවී ඇත. පහළ පාන්තිකයන්ගේ අසරණ තත්ත්වය, වරප්‍රසාද ලත් පන්තිය අනිසි ලෙස පරිහරණය කරන ආකාරයද මෙහි දී විස්තර වේ.

පොල් බක්කියේ පුංචි ම පොල් ගෙඩිය ප ලා
පස් වාරයක් මිරිකා අන්තිමට ත ළා
හොද්දට නො දා - තිබුණොත් හෙම ඉවත හෙ ළා
මුදලාලිගේ අත එයි කණ හරහ බ ලා (අල්විස් පෙරේරා,1946:31)

දිළිඳුකමට එකම ප්‍රතිකර්මය ලෙස මෙරට ජනයා දුටුවේ මෙහෙ කිරීමය. මව හෝ පියා හෝ දෙදෙනාම මිය යාමෙන් හෝ අනාථභාවයට පත්වන දරුවන් සිය මාමා හෝ නැන්දා කෙනෙකුට භාර වීමෙන් අනතුරුව ධනවත් පවුල් වෙත යොමු කෙරේ. මේ අවස්ථාවන්හිදී මෙම දරුවන් බොහෝ විට රැගෙන එන්නේ පාසල් යැවීමේ, ඇති දැඩි කිරීමේ ව්‍යාජයෙනි. සැබවින්ම ඔවුන් යොදා ගැනෙනුයේ මෙහෙකාර වෘත්තියටය (විජයසේකර,1960:228).

පාලම් තැනීමට පෙර ගං හෝ ඇල මාර්ගවලින් සිදු කළ ප්‍රවාහන කටයුතු සඳහා මිනිසාට බෙහෙවින් උපකාර වූයේ ඔරු - පාරු යනාදියයි. මෙම ප්‍රවාහන ක්‍රමය අතීතයේ සිට අද දක්වාම ලාංකේය ජනතාව සිය එදිනෙදා කටයුතු සඳහා යොදා ගනී. ඔරු, පාරු පැදවීමද වෘත්තියකි. දුෂ්කර වෘත්තියකි. 'ඔරු පදින්නා' හැමවිටම සමාජයේ පහළ ස්තරය නියෝජනය කළේය. 'ඔරු පැදීම' නම් මාතෘකාවෙන් යුතු කවි පන්තියෙන් විග්‍රහ වනුයේ එවැනි පුද්ගලයෙකුගේ ජීවිතයකින් අංශුමාත්‍රයකි.

පාන් ගෙඩිය බුදිමින් තේ වතුර පො ගා
කුසගිනි මකා වහලෙකු මෙන් විඳින නි ගා
සම රත්වෙමින් ඩහදිය බිඳු නළල න ගා
හති දම දමා මොහු යන හැටි හබල ග ගා

ගණනක් අතර රුපියල් තිහ හතළිහ ට
උපයන නමුත් මේ මිනිහා දවසක ට
මොහුගේ වැටුප වැටෙමින් රුපියලක පි ට
අන් සැම මුදල් යයි දනපති හැඹිලිය ට (අල්විස් පෙරේරා,1946:45)

''මෙලෙස ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය තුළ මූලික නිෂ්පාදකයා වන ශ්‍රමිකයා නිෂ්පාදන මාර්ගවලින්ද, ශ්‍රමයේ ඵලයෙන් හා තමාගේ ශ්‍රම ශක්තියෙන්ද වියුක්ත වූ ඒ සම්බන්ධ කිසිදු අයිතිවාසිකමක් හිමි නොවූ, එහෙයින්ම නිෂ්පාදන කාර්යය අප්‍රිය හා අතෘප්තිකර කාර්යයක් බවට පත්වූ හුදකලා පුද්ගලයෙකු බවට පත්වන අතරම

ස්වකීය ශක්‍යතාවන්, නිෂ්පාදන කාර්යය හා සමස්ත සමාජ ජීවිතයම සිය කැමැත්තට පිටින් ධනවාදී වෙළෙඳපොළ කොන්දේසි මත තීන්දුවන බැවින් පරායත්ත පුදුගලයෙකු බවට පත්වේ'' (බණ්ඩාර,2020 අගෝස්තු-දෙසැම්බර්:136). මෙහිලා දැක්වෙන පරිදි ඔරු පදින්නාට ස්වකීය ජීවිතය නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් වැටුපක් ලැබී නැත. එහෙයින්ම රැකියාව පිළිබඳ තෘප්තිමත් බවක් හෝ සේවය පිළිබඳ කැමැත්තක් හෝ ඔහුට නැත. එබැවින් ඔහු එවක වැඩි වැටුපක් ලබාගත හැකිවූ යුද සේවයට බැඳීමට තීරණය කර ඇති බව කවියා දක්වා ඇත්තේ ජීවිතයට මිලක් නියම කර ඇති බවද ව්‍යංග්‍යයෙන් දක්වමිනි.

බැහැ හාමතේ හබලට අත තියන්න ට
රුපියලකට නොහැක වේලක් බුදින්න ට
නොහැකිය කියා මේ හැටි දුක් විඳින්න ට
මොහු යනවාලු මිලිටරියට බැඳෙන්න ට (අල්විස් පෙරේරා,1946:45)

අතීත සමාජයේදී ජීවිකාව සරිකර ගැනීම පිණිස සාමාන්‍ය ජනතාව නියැළුණු වෘත්තියක් ලෙස 'ගස් මැදීම' දැක්විය හැකිය. රා, තෙලිජ්ජ, හකුරු සඳහා කිතුල් හා පොල් මල් කැපීම හා තැලීම එහිදී සිදුවේ. මේ වනාහි සෙසු වෘත්තීන්ට වඩා අවදානම් වූ වෘත්තියකි. මොවුන් රැකියාව කරනුයේ ගස් දෙකක් අතර බැඳ ඇති ලණු පොටවල් හෙවත් 'අතුරෙහි' ගමන් කරමිනි. ජීවිතය පරදුවට තබා කළ යුතු කාර්යයක් වුවද ඔවුන්ගේ ජීවිත පිළිබඳ සුරක්ෂිතතාවක් නැත. මේ මිනිසුන්ගේ ජීවිතවලට ඔවුන්ගෙන් සේවය ලබාගන්නා අය වග නොකියති. ඔවුන්ට සිය ශ්‍රමයට සරිලන වැටුපක්ද හිමි නොවේ. අලවිස් පෙරේරා 'ගස් මදින්නා' නම් කවි පන්තිය ඔස්සේ විවරණය කර ඇත්තේ එකී තත්ත්වයයි.

ධනපතියෙකු වෙන්ට දී මිනිහෙකුට ඉ ඩ
උඹ ජීවිතය එල්ලා ඔය කඹය උ ඩ
යන්තම් යැපෙන බව කර මුළු දවස වැ ඩ
දිගටම කියා දෙයි මට මල් තැළෙන හ ඬ (අල්විස් පෙරේරා,1946:24)

ගස් මදින්නා සිය සේවයට සරිලන වැටුපක් නොලැබූවද ඔහුගේ ශ්‍රමය නිසා අනෙකාට ධනපතියෙකුවීමේ අවස්ථාව සැලසී ඇති බව කවියා මෙහිදී පෙන්වා දෙයි. ''ධනේශ්වර ක්‍රමය තුළ සැබෑ නිෂ්පාදකයන් වන ශ්‍රමිකයා තම ශ්‍රමයේ ඵලය භුක්ති විඳීමෙන් බැහැර කෙරෙයි. නිෂ්පාදිතය සඳහා අයිතිවාසිකමක් නිෂ්පාදකයාට නැත. ඔහු වැටුප පිණිස ශ්‍රමය වැය කොට වැටුප නමැති මුදලින් ස්වකීය නිෂ්පාදිතයම මිලට ගනී'' (බණ්ඩාර,2020 අගෝස්තු-දෙසැම්බර්:135-136). ගස් මදින්නා ලබා දෙන ඵලදාවෙන් මත්පැන් සැකසීම නිසා සමාජයට අහිතකර දෙයක් සිදුවේ. එසේ වුවද මත්පැන් අලෙවිහලේ අයිතිකරු ඉන් ලැබෙන මුදලින් පින් දහම්වල නිරතවීමෙන් විශද වන්නේ මුදලට ඇති බලය හා ශක්තියයි. දන් පින් කරන සුරාසැල් අයිතිකරුගෙන් ගස් මදින්නාට සිදුවන සෙතක් නැත. කවියා ඊට සිය අප්‍රසාදය පළ කර ඇත්තේ මෙසේය.

අතුරේ රැහැන්පට ඔස්සෙහි දෙපිය ඔ බා
උඹ මෙහෙ කළත් ජීවිතයක් පරදු ත බා
රේන්දයේ අයිතිය වෙන කෙනෙකු ල බා
අරඹයි හෙතෙම ආගම දියුණුවට ස බා

ජීවත් වෙන්ට මහ සටනක් අතුරු පො ටේ
අරඹා මල් තැළුවත් උඹෙ පිහිය කො ටේ
මුදලාලිගේ නම පන්සල් තොරණේ වැ ටේ
බොරුවට මිසක් ඉඩ නැහැ ඇත්තකට ර ටේ (අල්විස් පෙරේරා,1946:24)

යට දැක්වූ ආකාරයේම ජීවිත අවදානමකින් යුතු වෘත්තියක් ලෙස පතල් කර්මාන්තය හැඳින්විය හැකිය. එම වෘත්තියෙහි භාරදූර බවට සාපේක්ෂව ප්‍රමාණවත් වැටුපක් ඔවුන්ටද නොලැබේ. කායික ශ්‍රමිකයන්ට රැකියා වෙළඳපොළෙහි හිමි වී ඇති පහත් ස්ථානය, ඔවුන් ගත කරන පහළ පාන්තික ජීවන තත්ත්වයෙන්ම පැහැදිලි වේ. කායික ශ්‍රම කම්කරුවන්ට හිමි වන්නේ කායික නොවන ශ්‍රම සේවා සපයන අයට වඩා පහළ වැටුපකි. තවද වෘත්තීය ස්වරූපයේ ඇති අවදානම් සහගත බව සහ සුරක්ෂිතතාවක් නොමැති බැවින් අඩු වයසින් ජීවිතක්ෂයට පත්වීමටද කායික ශ්‍රමිකයන්ට සිදුවේ (ජයසිංහ,2004:156-158). මෙබඳු අවදානම් සහගත රැකියාවක නිරත වෙමින් වෙනත් පන්තියකගේ අවශ්‍යතා සඵල කර ගැනීම උදෙසා දුක වුව විනෝදයක් සේ විඳින්නට ඔවුන් පුරුදු වී ඇත. එසේ පුරුදු වීමම ප්‍රාග්ධන හිමියාගේ ජයග්‍රහණයකි. 'මිනිරන් පතල' නමැති කවි පන්තියෙන් විශද කර ඇත්තේ එකී යථාර්ථයයි.

කණිමින් යාර සිය ගණනක් පොළොව ය ට
අනිකෙකු සවි කරන්නට දිවි පරදුව ට
වෙන්කොට තබා මිණිරන් පතලකට බ ට
මිනිහා වීරයෙකු මෙන් හඳුනතිද ර ට

අඩියෙන් නැඟී එන වතුරෙන් නොගෙන වි ඩා
සොහොයුරු පිරිස සහ සිව්පද රසය දො ඩා
දෝනා යට වැදී මිනිරන් කැබැලි ක ඩා
මොහු කරනා වැඩට නොමැනවි වැටුප කු ඩා (අල්විස් පෙරේරා,1946:23)

විරැකියාව, සේවය අත්හිටුවීමේ අවදානම, කෙටිකාලීන රැකියා අවස්ථා පමණක් හිමිවීම කායික ශ්‍රම සපයන කම්කරු ප්‍රජාවට මුහුණ පෑමට සිදුවන අනිවාර්ය කරුණුය (ජයසිංහ,2004:156-157). එය විශේෂයෙන්ම කම්කරු පන්තිය මුහුණ පාන ගැටලුවකි. මෙම ගැටලුව අල්විස් පෙරේරා සිය කවි පන්තියකට විෂය කර ගෙන ඇත. ඔහුට හමුවූ කම්කරුවා සේවය අත් හිටුවීමේ සහ වෙනත් රැකියාවක් සොයා ගැනීමට නොහැකි වීමේ අවදානමටත් මුහුණ දුන් අයෙකි. අවසානයේදී ඔහුට සිදුව ඇත්තේ යාචක වෘත්තියට අවතීර්ණ වීමටය. මෙහිදී කවියා කම්කරු ජීවිතයේ අවසානය වන්නේ මෙයදැයි ප්‍රශ්න කරමින් පන්ති සමාජයේ සමාජ චලනතාව පිළිබඳ ලක්ෂණය 'කම්කරු පවුල' නමැති කවි පන්තියෙන් ඉස්මතු කර ඇත. එනම්, මෙම සමාජ ක්‍රමයේදී සාමාජිකයාට සිය සමාජීය ස්ථාවරය තීරණය කරගැනීමට නොහැකි වීමය. අවරෝහණාත්මක චලනතාවකට හෙවත් සිටිනා තත්ත්වයෙන් පහළ තත්ත්වයටකට වැටීමට මේ කම්කරුවාට සිදුවීමය. ''ශ්‍රමයෙහි විෂමතාවන් නැතිකරලීම, කම්කරු පන්තිය හිඟමනට ඇද දැමීම හා අතරමැදි පන්තිය පීඩනයට ලක්කොට කම්කරු පන්තියට තල්ලු කිරීම යන ක්‍රියාදාමයේ ප්‍රතිඵලය වන්නේ ධනේශ්වර හා කම්කරු යනුවෙන් එකිනෙකට ඉඳුරා වෙනස් ගති ලක්ෂණවලින් යුක්ත පැහැදිලි පන්ති දෙකක් නිර්මාණය වීමයි'' (ජයසිංහ,2004:156-157).

රස්සාවක් නැතිව සිවු මසකට උඩ දී
පස් කැපුමට ගොහින් එහි දෙමසක් වැඩ දී
අස් කළ බැවින් මොහු ජීවිත පඩි කඩ දී
ලිස්සා ඇද වැටුණි ඉරණමටම ඉඩ දී

පෙ ම් වත් පවුල රැකුමට වෙරකින් යෝ ද
උ ම් බල කඩ වැටක් මෙන් ඉළ ඇට පෑ ද
ය ම් තම් සිඟා එයි මොහු මොන මොනවා ද
ක ම් කරු ජීවිතයෙ අවසානය මේ ද? (අල්විස් පෙරේරා,1946:29)

මේ අයුරින් කම්කරු ප්‍රජාව නිරත වන රැකියාවල ස්වරූපයත්, ඔවුන් අත්විඳින පහළ පාන්තික ජීවන තත්ත්වයත් අවම වැටුප් පරිමාවත් පිළිබඳව වේදනාව කාව්‍ය සංග්‍රහයේ කාව්‍ය නිර්මාණවලින් විස්තර වී ඇති බව පැහැදිලිය.

## 3. සමාලෝචනය

පී.බී. අල්විස් පෙරේරාට විෂය වූයේ සමකාලීන සමාජයයි. පහළ පාන්තික ස්තරයයි. කායික ශ්‍රමික ජීවන තත්ත්වයයි. වේදනාව කාව්‍ය සංග්‍රහයේ අන්තර්ගත වී ඇත්තේ විවිධ වෘත්තීන්වල නිරත කම්කරු ප්‍රජාව පිළිබඳව අල්විස් පෙරේරාගේ නිරීක්ෂණය හා දෘෂ්ටියයි. මෙකී විග්‍රහය සඳහා පාදක කරගෙන ඇත්තේ කවි පන්ති හයකි. තේ දලු බිඳින තරුණිය, සිල්ලර කඩේ කොලුවා, ඔරු පදින්නා, ගස් මදින්නා, මිනිරන් පතල හා කම්කරු පවුල ඒවාය. එකිනෙකට වෙනස් වෘත්තීන් හයක් පිළිබඳව අල්විස් පෙරේරාගේ විග්‍රහය මේ කවිවල අන්තර්ගත වේ. කවියාගේ නිරීක්ෂණයට අනුව රචිත බැවින් මේ කවි පන්ති සියල්ලෙන්ම විද්‍යමාන වන්නේ වාර්තාමය ස්වරූපයකි. එසේ වුවද කාව්‍යාන්තර්ගතයෙන් ගම්‍යමාන වන්නේ තත්කාලීන සමාජ යථාර්ථයයි. එනම්, සුළුතර පිරිසකගේ සුඛ විහරණය පිණිස බහුතර ප්‍රජාවකට අසීමාන්තික ලෙස ශ්‍රමය වැගිරීමට සිදු වී ඇති ආකාරයය; ඊට සරිලන වැටුපක් ඔවුන්ට හිමි නොවීමය; ඒ ඒ වෘත්තීන්ට අනුව කම්කරු ප්‍රජාව ප්‍රාග්ධන හිමියාගේ ශ්‍රම සූරාකෑමට ලක්වෙන ආකාරයය. තවද අවම වැටුප් පරිමාවක් යටතේ සිය සේවකයන්ගෙන් වැඩි ශ්‍රම දායකත්වයක් ලබා ගනිමින් ශ්‍රම සූරාකෑමේ නියැළෙන ප්‍රාග්ධන හිමියා සමාජය ඉදිරියේ පෙනී සිටින්නේ සත්ගුණවත්, දානපති, ආගමික ළැදි මිනිසෙකු ලෙසින් බව අල්විස් පෙරේරාගේ අදහස වී ඇත. එමෙන්ම මෙකී වරප්‍රසාද හිමි පන්තිය වෙනුවෙන් නීතිය හා බලය හිමි පන්තියද පෙනී සිටින බවය. අඩු වැටුප්ලාභියෙකු ලෙස ස්වකීය ජීවන තත්ත්වය නගා සිටුවාලීමේ අවකාශය අහිමි වූ කම්කරු ප්‍රජාවට රැකියාව වූකලි අතෘප්තිකර වෙහෙසකර කාර්යයක් පමණි. ජීවිත අවදානම, සේවය සුරක්ෂිත නොවීම, සේවය අත්හිටුවීමේ අවදානම, කෙටිකාලීන රැකියා අවස්ථා පමණක් හිමිවීම යන කරුණු හේතුවෙන් වැටුප් ශ්‍රමික කම්කරු ප්‍රජාවට අවරෝහණාත්මක චලනතාවකට හෙවත් සිටිනා තත්ත්වයෙන් පහළ තත්ත්වයටකට වැටීමට සිදුවන අවස්ථා බහුලය. ඒ අතර ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවන අවස්ථාද වේ. මේ වැටුප් ශ්‍රමිකයන්ගෙන් සේවය ලබන ප්‍රාග්ධන හිමි පිරිස වූකලි මුදල් ඉපයීම ජීවිතයේ එකම නිෂ්ඨාව කරගත් පිරිසක් වන අතර එය සාක්ෂාත් කරගනු වස් අමානුෂික ලෙස ක්‍රියා කරන්නෝ වෙත්. ශ්‍රම සූරා කෑමට අමතරව වැටුප් ශ්‍රමික කම්කරු ප්‍රජාව පීඩනයට ලක් කිරීම සිදුවන්නේ එනිසාය. එබැවින් අල්විස් පෙරේරා ඔවුන්ගේ ක්‍රියා කලාපය විස්තර කර ඇත්තේ අප්‍රසාදයෙනි. එහෙත් කම්කරු ප්‍රජාව කෙරෙහි වූ ඔහුගේ දෘෂ්ටිය මානව හිතවාදීය. පාන්තික හැඟීමෙන් සන්නද්ධය. ඔහු නියෝජනය කරනුයේ කම්කරු ප්‍රජාවගේ පාර්ශ්වයයි. එනිසාම මේ කවි පන්තිවලින් පන්ති වෛරයක ස්වරූපයක් විද්‍යමාන වීම වැළැක්විය නොහැකිය.

## පරිශීලිත මූලාශ්‍රය


අල්විස් පෙරේරා, පී. බී., (1946). ***වේදනාව,*** කොළඹ: ස්වස්තික යන්ත්‍රාලය

කුමාරසිංහ, කුලතිලක. (2001). ***නූතන කාව්‍ය විමර්ශන-ලේඛන*** (ප්‍රථම භාගය), කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

ජයකොඩි, ධර්මප්‍රිය. (1969). ***මියගිය කොළඹ කවියෝ,*** කොළඹ

ජයසිංහ, ඒ. කේ, ජී., (2005). ***සමාජ ස්තරායණය,*** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

ද සිල්වා, රසාංගිකා, (2005). ***ශ්‍රී ලංකාවේ තේ ඉතිහාසය,*** ජා - ඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ

ධම්මින්ද හිමි, අඟුලුගහ, (1991). මොරටුව***, සිංහල කාව්‍යයේ නව ප්‍රවණතා,.***

බණ්ඩාර, නේරංජ, ***'සාහිත්‍ය කලා පිළිබඳ මාක්ස්වාදී අර්ථකථනය',*** (2020 අගෝ-දෙසැ. කලාපය) විදුදය, (සංස්.) නේරංජ බණ්ඩාර සහ තවත් අය, නුගේගොඩ: සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය (109-150)

මල්ලිකාරච්චි, ඩෙස්මන්, (2011). ***මාක්ස්වාදී රචනා,*** නුගේගොඩ: සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන

රාජකරුණා, ආරිය. (2004). ***නූතන සිංහල කාව්‍ය 2,*** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

විජේගුණසිංහ, පියසීලි, (2017) ***නූතන සිංහල පද්‍ය කාව්‍යය පිළිබඳ විමර්ශනයක්,*** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

විජේසේකර, නන්දදේව, (1960) ***ලංකා ජනතාව,*** කොළඹ: සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

හේවාමද්දුම, අමර සහ විජේසූරිය, සරත් (1993), (සංස්.) ***පී. බී. අල්විස් පෙරේරා පැදි එකතුව***, කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

මාක්ස්වාදයේ හෝඩිය, (1948), (කර්තෘ නැත) කොළඹ: ලංකා සමසමාජ පක්ෂය